රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94

යොමු අංකය :- ඇස්ඒ/ඒඒජ්/පීඩී/ඒ/25
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01
1994 අප්‍රේල් 20 දින දී ය.

සියළුම ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

විදේශාධාර ගිණුම් තැබීම

මෙම චක්‍රලේඛය, උක්ත විෂයය සම්බන්ධයෙන් මීට ප්‍රථම නිකුත් කරන ලද සියළුම භාණ්ඩාගාර චක්‍ර ලේඛන අභිබවා සිටී.

2.0 විදේශාධාර ගනුදෙනු

විදේශාධාර සම්බන්ධ, සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ යුතු අතර, කිසියම් ව්‍යාපෘතියක් හෝ අරමුණකට අදළ විදේශාධාර පිළිබඳ විමසිය යුත්තේ විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගෙනි. (වි. ස. අ. ජ.)

3.0 විදේශාධාර වර්ග

3:1 රජය වෙත ලැබෙන විදේශාධාර පහත සඳහන් පරිදි වර්ග කෙරේ :

ආධාර වර්ගය	වගන්තිය	ආධාරයේ ස්වභාවය
1. ව්‍යාපෘති ආධාර	(අ) ණය/ණය මාලාව (ආ) ප්‍රදාන	මුදල්, උපකරණ, ද්‍රව්‍ය සහ ආනුෂාංගික සේවාවන් ව්‍යාපෘතියක පිරිවැය කොටසක් වශයෙන් ලැබෙන උපදේශාත්මක හා අනුෂාංගික සේවාවන් සහ ශිල්පය සහාය
2. ශිල්පීය සහය	(අ) ණය (ආ) ප්‍රදාන	ශිෂ්‍යත්ව, පුහුණු පහසුකම්, විශේෂඥ සේවාවන් සහ අනුෂාංගික ද්‍රව්‍ය, මුදල් සහ උපකරණ
3. භාණ්ඩ ආධාර	(අ) ණය (ආ) ප්‍රදාන	ග්‍රාහක ආයතන වලින් ලැබෙන්නාවූ භාණ්ඩ, උපකරණ සහ සැපයුම් ආදියේ වටිනාකම දේශීය වශයෙන් ප්‍රතිපාර්ශවීය ගිණුමක තැන්පත් කර අනුමත ව්‍යාපෘති සඳහා වියදම් කිරීමට මුදල් ලබා දෙන්නාවූ පහසුකමකි.

	ආධාර වර්ගය	වශත්කිය	ආධාරයේ ස්වභාවය
4.	වැඩ සටහන් ආධාර	(අ) ණය (ආ) ප්‍රදාන	විශේෂිත වැඩ සටහන් වල දේශීය වැය පියවීම සහ ආනයන යන්ගේ විදේශ විනිමය පිරිවැය පියවීම පිණිස වන මූල්‍ය සහාය
5.	ගෙවීම් ශේෂ සහාය	(අ) ණය (ආ) ප්‍රදාන	ද්විපාර්ශවීය සහ බහුපාර්ශවීය ප්‍රදාන කරුවන්ගෙන් විදේශ විනිමය සහාය

3:1:1 ව්‍යාපෘති ආධාර (ප්‍රාග්ධන ආධාර)

ව්‍යාපෘති ආධාර හෝ ප්‍රාග්ධන ආධාර, රජයේ ඇස්තමේන්තු ගත වියදම් ගණනය කිරීමේ දී උපයෝගී කරගෙන ඇති අතර, ඒවායේ පරිශීලනය පිණිස වාර්ෂික ඇස්තමේන්තු වල පුනරාවර්තන හෝ ප්‍රාග්ධන ව්‍යාපෘති යටතේ ප්‍රතිපාදන සලසා තිබිය යුතු වේ. මුදල්, ද්‍රව්‍ය, උපකරණ හා අනුෂාංගික සේවාවන් ලෙස දෙනු ලබන මෙම ව්‍යාපෘති ආධාර ණය (ණය මාලාවන් ඇතුළුව) සහ ප්‍රදාන වශයෙන් ලැබේ. යම් ව්‍යාපෘතියක පිරිවැයේ කොටසක් වශයෙන් ඇතුළත් වන විශේෂඥ සේවා, අනුෂාංගික සේවා සහ ශිල්පීය සහය වශයෙන් ද මෙම ව්‍යාපෘති ආධාර ලැබිය හැකිය.

3:1:2 ශිල්පීය සහාය

ශිල්පීය සහාය යටතේ විශේෂඥ සේවා, ශිෂ්‍යත්ව අභ්‍යාස පහසුකම් ද, මුදල්, උපකරණ සහ ද්‍රව්‍යයන් ද ඇතුළත් වේ. මේවා ලැබෙනුයේ ශිල්පීය සහාය පිළිබඳ වැඩ සටහන් යටතේ ප්‍රදානයන් වශයෙනි. ශිල්පීය සහාය ව්‍යාපෘති ආධාරයක පිරිවැයේ කොටසක් ආකාරයෙන් ද ලැබිය හැකි අතර, එය එවිට ණයක් හෝ ප්‍රදානයක් විය හැක. ශිල්පීය සහය යටතේ වැය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය කිරීම සම්බන්ධව 4:2:2 ඡේදය බලන්න.

3:1:3 භාණ්ඩ ආධාර

භාණ්ඩ ආධාර යනු ප්‍රදාන කරුවෙකු විසින් සපයන ලද ද්‍රව්‍ය, උපකරණ, සැපයුම ආදියක වටිනාකම අනුමත වැඩ සටහන් හෝ ව්‍යාපෘති වියදම් වෙනුවෙන් යෙදවීම සඳහා දේශීය ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමක තැන්පත් කළ හැකි පහසුකමකි. මෙම ආධාරය ණයක් හෝ ප්‍රදානයක් විය හැක. මෙම භාණ්ඩ ලබන්නා වූ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා සංස්ථා කිසියම් භාණ්ඩයක මිල, රක්ෂණ, ගැල්කුලිය (මි. ර. ගැ.) වටිනාකමට සමාන මුදලක් ප්‍රදාන කරුවා විසින් එකඟ වන ලද අනුමත වැඩ සටහන් හෝ ව්‍යාපෘති වල වියදම් කිරීම පිණිස, ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යන්නා වූ ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමකට රුපියල් වලින් ගෙවිය යුතුය. ප්‍රතිපාර්ශවීය අරමුදල් වලින් වියදම් කිරීම සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ඇස්තමේන්තු වල, මූල්‍යකරණ සංකේත අංක 16 යටතේ ප්‍රතිපාදන සලස්වා තිබිය යුතුය.

3:1:4 වැඩ සටහන් ආධාර

වැඩ සටහන් ආධාර යනු අයවැය ඇස්තමේන්තුවල වැයට ආධාරක වශයෙන්, විශේෂිත වැඩ සටහන් සඳහා ණය සහ ප්‍රදාන ආකාරයෙන් ලැබෙන මූල්‍ය ආධාර වේ. මෙම ආධාර උපයෝගී කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍යවන අවස්ථා වලදී භා වි. ස. අ. ජ සහ ජාතික අය වැය අධ්‍යක්ෂ ජනරාල් (ජා. අ. අ. ජ.) විමසිය යුතුය.

3:1:5 ගෙවුම් ශේෂ සහයන්

රජය විසින් ප්‍රදාන කරුවන්ගෙන් ගෙවුම් ශේෂ සහයන් ලබාගන්නේ අනුමත ආනයනයන් සහ අනෙකුත් විදේශ ගෙවීම් මත දැනටමත් දරා ඇති විදේශ විනිමය පිරිවැය පියවීම සඳහාය.

4.0 මූල්‍ය ප්‍රතිපාදන

4:1 ආදායම් ඇස්තමේන්තු

විදේශාධාර ලැබීම් වාර්ෂික ඇස්තමේන්තුවල පහත සඳහන් ආදායම් ශීර්ෂ යටතේ ගිණුම්ගත කරනු ලැබේ. තිසි ආදායම් ශීර්ෂ වලට බැර කිරීම් භාණ්ඩාගාරය විසින් කරනු ලැබේ.

ශීර්ෂ 8–2–2	ප්‍රාග්ධන නොවන මුදල් ප්‍රදානයන් ඇතුළුව විදේශ රාජ්‍ය වලින් සහ නියෝජ්‍යත්වයන් ගෙන් ලැබෙන ආධාර (ප්‍රාග්ධන උපකරණ හැර)
ශීර්ෂ 11–1–1	විදේශ ආණ්ඩු වලින් හෝ ආයතන වලින් තෑගි වශයෙන් ලැබුණු උපකරණ වල වටිනාකම
ශීර්ෂ 11–1–2	ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු මුදල් ප්‍රදාන
ශීර්ෂ 14–1	යෝජනා ක්‍රම, ණය
ශීර්ෂ 14–2	භාණ්ඩ ණය
ශීර්ෂ 14–3	අනෙකුත් ණය

4:2 වැය ඇස්තමේන්තු

4:2:1 විදේශාධාර ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදනය කළ යුත්තේ එම ව්‍යාපෘති රජය විසින් අනුමත කර ඇත්නම් පමණි. වාර්ෂික ඇස්තමේන්තු වල ප්‍රතිපාදන සලසා නොමැති අවස්ථාවකදී කිසියම් විදේශාධාරයක් උපයෝගී කිරීමට අවශ්‍ය වූ විට, ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් හෝ 'විරමෝං' ක්‍රියා පරිපාටිය මගින් හෝ ප්‍රතිපාදන සැලසිය යුතු වේ. විදේශාධාර මගින් මුදල් යොදවනු ලබන ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා අවම වශයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියවත් ලබා ගන්නා තුරු විදේශාධාර අපේක්ෂාවෙන් කිසිදු බැඳීමකට ඇතුළත් නොවිය යුතුය. එවැනි එක් එක් ව්‍යාපෘති සඳහා වෙන් වෙන් වශයෙන් පුනරාවර්තන හෝ ප්‍රාග්ධන ව්‍යාපෘති සහ වැය සංකේත යටතේ පහත දක්වෙන පරිදි මුදල් යෙදීමේ විස්තර ද සහිතව ප්‍රතිපාදන සලසා ගත යුතු වේ.

(11) ඒකාබද්ධ අරමුදල

(12) විදේශාධාර ණය (.......................... *)

(13) විදේශාධාර ප්‍රදාන (.......................... *)

(14) ප්‍රතිපූරණය කළහැකි විදේශාධාර ණය (.......................... *)

(15) ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර ප්‍රදාන (.................. *)

(16) ප්‍රතිපාර්ශවීය අරමුදල (.......................... *)

* ආධාර ලැබෙන මූලාශ්‍රය/ණය අංක

4:2:2 ශිල්පීය සහාය සම්බන්ධයෙන් වූ විට, එවැනි සහාය ව්‍යාපෘතියක කො
වශයෙන් යෙදේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වැය ඇස්තමේන්තු වල අ
කළ යුතුය. එම සහායයන් විශේෂඥ සේවා, ශිෂ්‍යත්ව අභ්‍යාස පහසුකම්
තත්කාර්ය ස්වභාවයක් දරන්නාවූ ද, ව්‍යාපෘතියක කොටසක් නොව
වූ ද ස්වරූපයක වේ නම්, ඒවා අයවැයෙහි වැයට බල නොපාන වූ
මුදල් ප්‍රතිපාදන සැලසීම අවශ්‍ය නොවේ. එවැනි අවස්ථා වලදී එම
ඇතුළත් වාර්තාවක් I සහ II ඇමුණුම මගින් වි. ස. අ. ජ. වෙත ඉ
කළ යුතුය.

4:2:3 එසේ වුව ද අත්තිකාරම් ගිණුමක් යටතේ විදේශාධාර වැය සිදුකර
අවස්ථාවන්හි දී ඒවායේ මුදල් ප්‍රමාණයන් සහ මූල්‍යකරණ වි
අත්තිකාරම් ගිණුම යටතේ පාද සටහන් මගින් දක්විය යුතුවේ.

4:3 ලබන අවස්ථාවේ දී ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන සලසා නො
උපකරණ සහ ද්‍රව්‍යමය පරිත්‍යාග

ජල ගැලීම්, නියග යනාදී විශේෂ අවස්ථාවලදී ද, ඇස්තමේන්තු කෙටුම්පත්
කෙරුණු අවධියේ දී අපේක්ෂා කරනු නොලැබූ අතිකූත් නිශ්චිත කාර්
සඳහා ද විදේශීය රාජ්‍යයන් ගෙන් සහ නියෝජ්‍යත්ව වලින් උපකරණ
ද්‍රව්‍යමය ත්‍යාගයන් ලැබේ. දෙපාර්තමේන්තු විසින් මෙම ත්‍යාගයන් පි
සටහන්, තම භාණ්ඩ ලේඛණවල හෝ වෙනයම් ලේඛණවල හෝ වෙන්
වශයෙන් සටහන්කොට තබා ගත යුතුය. එම ත්‍යාග ලැබුනු වර්ෂය ඇතු
දී හැකිනම් 'විරමෝං' ක්‍රියා පරිපාටිය මගින් හෝ පරිපූරක ඇස්තමේ
මගින් හෝ ඒ සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු අතර, එම ත්‍යාගවල වටිනා
5:2:3 ඡේදයේ දක්වා ඇති පරිදි ගිණුම් ගත කල යුතුය.

ත්‍යාගය ලැබුණු වර්ෂය තුළදීම 'විරමෝං' ක්‍රියා පරිපාටිය හෝ පරිපූ
ඇස්තමේන්තු ක්‍රමය උපයෝගී කරගත නොහැකි විශේෂ අවස්ථාවලදී ත්‍යාග
වටිනාකම ගිණුම් ගත කිරීම සඳහා ඊට පසු වර්ෂයේ ඇස්තමේන්තු මගින්
ප්‍රතිපාදන සලසා ගත යුතු වේ. නියම වටිනාකම දන්නේ නම් එහි වටිනාක
ගිණුම් ගත කල යුතු අතර එසේ නොමැති නම් වි. ස. අ. ජ. උපදෙස් මත තීරණ
කරන ලද ආසන්නතම වටිනාකමට ගිණුම් ගත කළ යුතු වේ.

4:4 රාජ්‍ය සංස්ථාවලට දෙනු ලබන විදේශාධාරවලට අදළ ප්‍රතිපාදන

4:4:1 විදේශාධාර දෙනු ලබනුයේ රාජ්‍යකින් තවත් රාජ්‍යයකට පදනම මත බැ
රාජ්‍ය සංස්ථාවලට/රාජ්‍ය ව්‍යාපාරවලට සියළු විදේශාධාර දෙනු ලබන්
රේඛීය අමාත්‍යාංශ මාර්ගයෙනි. එවැනි ආයතන විසින් ප්‍රයෝජනයට ගන්
කිසියම් විදේශාධාරයකට අදළව රජයේ වැය ඇස්තමේන්තුවල ප්‍රතිපාද
ඇතුලත් කිරීමේ වගකීම රේඛීය අමාත්‍යාංශය මත පැවරේ.

4:4:2 සංස්ථාවන්/රාජ්‍ය ව්‍යාපාර වෙත විදේශ ණය වලින් දෙනු ලබන ණ
සම්බන්ධයෙන් එම ණය මුදල නියමිත ලෙස ආපසු රජය වෙත ගෙවනු ලබ
බවටත්, ඒ පිළිබඳව පොලී ගෙවනු ලබන බවටත්, වග බලා ගැනීමට අද
අමාත්‍යාංශවල ලේකම් වරුන් විසින් ප්‍රමාණවත් පියවර ගනු ලැබිය යුතු

5.0 විදේශාධාර වැය ගිණුම් තැබීම

5:1 විදේශාධාර වැය භාණ්ඩාගාර පොත්වල සටහන් කිරීම

භාණ්ඩාගාර වැය වාර්තා, 4:2:1 ඡේදයේ සඳහන් මුදල් යෙදීමේ විස්තර අනුව විශ්ලේෂණය කරනු ලබන හෙයින් ගණන් දීමේ නිලධාරීන් විසින් විදේශාධාර ලබන ව්‍යාපෘතිවල වැය, අදාළ ශීර්ෂය, වැඩ සටහන, ව්‍යාපෘතිය, වැය සංකේතය සහ මූල්‍යකරණ සංකේතය යටතේ මාසික ගිණුම් සාරාංශ හෝ මාරු නියෝග මගින් වාර්තා කළ යුතුය.

5:2 ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් කෙරෙන ප්‍රදාන

5:2:1 කිසියම් නිශ්චිත ව්‍යාපෘතියක සෘජුවම ප්‍රයෝජනයට ගැනීම සඳහා ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් විදේශ ප්‍රාග්ධන ආධාර ලැබූ කල්හි එම අයිතමයන්ට අදාළ ලිපි ලේඛණවල තොරතුරු පදනම් කර ගෙන එකී ප්‍රදානයේ රුපියල් වටිනාකම අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කල යුතු අතර, එකී අගය යථාර්තවාදී නොවන අවස්ථාවල දී වි. ස. අ. ජ. ගේ අවධානයට එය යොමුකල යුතුවේ. ප්‍රමාණවත් තොරතුරු ලබාගත නොහැකි අවස්ථාවන්හි දී අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් වි. ස. අ. ජ. ගේ උපදෙස් ලබාගෙන එහි ඇස්තමේන්තු කරන ලද අගයක් ගණනය කල යුතු වේ.

5:2:2 උපකරණ සහ ද්‍රව්‍ය පිළිබඳ විස්තර, බඩු ලේඛණයෙහි හෝ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් මෙකී කාර්යය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වෙනත් ලේඛණයක හෝ වහාම සටහන් කළ යුතුය.

5:2:3 රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂක ජනරාල් (රා.ගි.අ.ජ.) ගෙන් අදාළ ප්‍රදාන ගිණුම් සංකේතය ලබා ගැනීමෙන් පසු පහත සඳහන් පරිදි වටිනාකම ගිණුම් ගත කල යුතුය.

හර:– ශීර්ෂය, වැඩ සටහන, ව්‍යාපෘතිය, වැය විෂය සහ මුදල් යෙදවීමේ සංකේතාංකය (විදේශ ආධාර ප්‍රතිපාදන)

බැර– මහා භාණ්ඩාගාර විදේශාධාර ප්‍රදාන ගිණුම් අංක ....

විස්තරය –

.... (ව්‍යාපෘතියේ නම) සඳහා ප්‍රදානයක් වශයෙන් .... ගෙන් (ප්‍රදානකරුගෙන්) ලැබුණු ද්‍රව්‍ය සහ උපකරණවල වටිනාකම.

5:2:4 මෙම ගනුදෙනුව " අ " පංතියේ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වූ විට භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කෙරෙන මාසික ගිණුම් සාරාංශ මගින් ද, අනිකුත් දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් පොදු 122 ආකෘති පත්‍රය මත වූ මාරු නියෝග මගින් ද, ගිණුම් ගත කල යුතු වේ.

5:2:5 ගිණුම් සාරාංශයේ හෝ පැවරුම් නියෝගයේ ඇතුලත් කරන ලද වටිනාකම සහිත සියළු උපකරණ සහ ද්‍රව්‍ය, බඩු ලේඛණයට හෝ දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා පවත්වාගෙන යනු ලබන වෙනයම් ලේඛණයකට ඇතුලත් කර ඇති බවට වග බලා ගැනීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීමක් වනු ඇත. එක්කම් ඇතුළත් කර ගන්නා ලද බඩු ලේඛණයක හෝ වෙනත් ලේඛණයක පත්‍රිකා අංකය දක්වෙන සහතිකයක් අදාළ පැවරුම් නියෝගයට යා කල යුතු වේ.

5:5:6 එලෙස කරන ලද හර කිරීම්වලට අදාළව III වන ඇමුණුමෙහි සඳහන් ආකෘතිය පරිදි ත්‍රෛමාසික ප්‍රකාශයක් රා.ගි.අ.ජ. වෙත ඉදිරිපත් කළ යුතුය.

5:3 උපකරණ, ද්‍රව්‍ය හා සේවාවන් වශයෙන් ලැබෙන ණය

5:3:1 ණය සහ ණය මාලා යටතේ ලැබෙන උපකරණ, ද්‍රව්‍ය හා විශේෂඥ සේවාවන් සම්බන්ධයෙන් එම යෝජනා ක්‍රම සඳහා මුදල් යොදවනු ලබන අදාළ ණය මුදල් යටතේ ණය ප්‍රතිලබ්ධයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාසිකව/ත්‍රෛමාසිකව රා. ගි. අ. ජ. වෙත වාර්තා කරනු ලැබේ. ඒ වෙනුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ගිණුම් ගත කිරීම් සටහන් පහත සඳහන් වේ.

හර– අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ අදාළ ශීර්ෂය, වැඩ සටහන, ව්‍යාපෘතිය, වැය විෂය, මුදල් යෙදවීමේ විෂය (විදේශාධාර ප්‍රතිපාදනය)

බැර– ව්‍යාපෘතිය, ක්‍රියාත්මක කරනු ලබන අදාළ ණය ගිණුම.

විස්තරය – ....
ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරි විසින් දන්වන ලද .... (ප්‍රදානයේ නම, ණය අංකය, ව්‍යාපෘතියේ නම) වෙනුවෙන් .... අවසාන කාර්තුවේ දී දරන ලද ණය ප්‍රතිලබ්ධයන්

5:3:2 රා. ගි. අ. ජ. විසින් පැවරුම් පත්‍රයේ පිටපතක් දැන ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත. භාණ්ඩාගාරය විසින් කරන ලද හර කිරීම අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් විදේශ ණය මුදලින් ප්‍රතිලබ්ධ කරන ලද මුදල සමග සසඳා දෙපාර්තමේන්තුවේ විසර්ජන ලෙජරයෙහි විදේශාධාර ප්‍රතිපාදනය සඳහන් කර ඇති පත් ඉරුවෙහි සටහන් කල යුතුය.

5:3:3 උපකරණ සහ ද්‍රව්‍යවල විස්තර බඩු ලේඛණය යටතේ ඒ සඳහා පවත්වාගෙන යනු ලබන අතිකුත් ලේඛණවලට ඇතුලත් කරන ලද බවට අමාත්‍යාංශ ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් වගබලා ගත යුතුය.

5:3:4 කිසියම් හේතුවක් නිසා හර කිරීම් අදල නොවන කල්හි වි. ස. අ. ජ. පිටපතක් සහිතව රා. ගි. අ. ජ. සමග එම කරුණ නිරවුල් කරගත යුතුය.

5:3:5 උපකරණ සහ ද්‍රව්‍ය භාරගත් බවත්, බඩු ලේඛණයෙහි හෝ ඒ සඳහා පවත්නා වෙනත් ලේඛණයක එය ඇතුලත් කරන ලද බවත්, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් කරන ලද හර කිරීම් නිවැරදි බවට සහතික කරමින් IV ඇමුණුමෙහි පරිදි ත්‍රෛමාසික ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අමාත්‍යාංශ ලේකම්ගේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ වගකීමක් වන්නේය.

5:4 මුදලින් ලැබෙන ප්‍රදානයන්

කිසියම් ව්‍යාපෘතියක් වෙනුවෙන් භාණ්ඩාගාරයට මුදල් ලැබුණ විට ඒවා වියදම් කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රදාන තැන්පත් ගිණුමට එය බැර කරනු ලැබේ. ප්‍රදාන කරුවන්ගෙන් කෙලින්ම මුදල් ප්‍රේෂණ ලබන්නාවූ දෙපාර්තමේන්තුව /අමාත්‍යාංශයද

එවැනි ලැබීම් භාණ්ඩාගාරයේ තැන්පත් කළ යුතුය. දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ එවැනි ප්‍රදානයක් උපයෝගී කර ගැනීම සඳහා ඇස්තමේන්තු වල ප්‍රතිපාදන ඇතිකල යුතු අතර, අදළ ප්‍රදාන තැන්පතු ගිණුම් වලින් මුදල් වෙන් කිරීම පිණිස වි.ස.අ.ජ. මගින් රා.ගි.අ.ජ. ට ඉල්ලුම් කර කිසියම් බැදීමක් හෝ වැයක් කිරීමට පෙර එය ලබාගත යුතුය. දෙපාර්තමේන්තු විසර්ජන (වැය) ලෙජරයේ අදළ විදේශාධාර ප්‍රතිපාදනය ඇතුළත් කරන ලද පත් ඉරුවෙහි එම වෙන් කිරීම සටහන් කළ යුතු අතර, වැය සියල්ල ඇස්තමේන්තු වල ප්‍රතිපාදනයට හර කළ යුතුය.

5:4:1 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ක්‍රියා පරිපාටිය වනුයේ

හර :– අදළ ශීර්ෂය, වැඩ සටහන, ව්‍යාපෘතිය වැය විෂය – විදේශාධාර පිළිබඳ මුදල් යෙදීමේ සංකේතය.

බැර – මුදල්

විස්තරය – .... (ප්‍රදාන ගිණුමේ නම) යටතේ මුදල් වෙන් කිරීමෙන් සිදු කරන ලද වැය.

වැය කෙසේ වුවද වෙන් කරන ලද මුදල හෝ ඇස්තමේන්තුවේ අදල විදේශාධාර ප්‍රදානයන් නොඉක්මවිය යුතුය.

5:4:2 'අ' පන්තියේ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වූ විට, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට යවන මාසික ගිණුම් සාරාංශ මගින් ද අනිකුත් දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වූ විට, පොදු ආකෘති පත්‍ර 122 මත පැවරුම් නියෝග මගින් ද වැය ගිණුම් ගත කළ යුතුය.

5:4:3 V වැනි ඇමුණුමෙහි ආකෘති පත්‍රයෙහි පරිදි ත්‍රෛමාසික ප්‍රකාශයක් රා.ගි.අ.ජ.ට සහ වි.ස.අ.ජ.ට ඉදිරිපත් කළ යුතුය.

5:5 විදේශ රාජ්‍යයන්ගෙන් හෝ නියෝජ්‍යත්වයන්ගෙන් මුදලින් ලැබෙන ණය

මුදල් ප්‍රේෂණ ලැබුණු විට වි. ස. අ. ජ. විසින් එම මුදල් අදළ දෙපාර්තමේන්තුවට ද, රා. ගි. අ. ජ. ද දනුම් දෙනු ඇත. එවිට, රා. ගි. අ. ජ. විසින් එම මුදල අදළ ණය ගිණුමට බැර කරනු ඇත. ඇස්තමේන්තු වල විදේශාධාර ප්‍රතිපාදනය සටහන් කරන ලද විසර්ජන (වැය) ලෙජරපත් ඉරුවල දෙපාර්තමේන්තුව විසින් තමන්ට දනුම් දෙන ලද මුදල් ප්‍රමාණය සටහන් කළ යුතු අතර, 5:4 ඡේදයෙහි පරිදි එම ආකාරයෙන් ලැබුන ණය මුදල් ප්‍රමාණය නොඉක්මවන පරිදි ප්‍රතිපාදනය හර කරමින් වියදම් දරිය යුතු අතරම එම ඡේදයේ සඳහන් පශ්චාත් කටයුතු කළ යුතුය.

5:6 ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර

5:6:1 කිසියම් ව්‍යාපෘතියක පිරිවැය පළමුව ශ්‍රී ලංකා රජය විසින් වියදම් කර එකී මුදල් ප්‍රදාන ආයතන මගින් මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ප්‍රතිපූර්ණය කරවා ගැනීමේ පදනම මත ශ්‍රී ලංකා රජය විදේශාධාර ගිවිසුම් වලට එළඹේ. මෙම ක්‍රමය ප්‍රතිපූර්ණය කළහැකි විදේශාධාර ලෙස හැඳින්වේ. මෙම ගිවිසුම් විදේශාධාර ණය හා ප්‍රදාන යන දෙවර්ගයටම අදළය. ව්‍යාපෘතිය වෙනුවෙන් වියදම් දරීම සඳහා ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර යටතේ ප්‍රතිපාදන සලසා තිබිය යුතුය. පරිපූරක ඇස්තමේන්තු හෝ 'වීරමෝං' ක්‍රියා පරිපාටිය මගින් ප්‍රදානයන්ගේ යම්කිසි වෙනසක් වේ නම් එය අප්‍රමාදව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්විය යුතුය. අදළ ප්‍රදානකරු විසින් ප්‍රතිපූර්ණය කරනු ලබන මුදල් ප්‍රමාණයන් විදේශ ණය හෝ ප්‍රදාන ගිණුමට ලැබීම් ලෙස සලකනු ලැබේ.

5.6.2 ආධාර නිසි පරිදි යෙදවීම, ගණන් තැබීම සහ ඵලදායී ලෙස පාලනය කිරීම වග බලා ගැනීම පිණිස අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් වෙනම අග්‍රිම ගිණුමක් සහ බැංකු ගිණුමක් පවත්වාගෙන යා යුතුය. ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර ප්‍රතිපාදන ඇතුළත් ව්‍යාපෘතියේ වියදම් පමණක් මෙම අග්‍රිමයෙන් දැරිය යුතුය. මෙම ආධාර වැය වෙනුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වෙනම අග්‍රිම සීමාවක් නියම කරනු ඇත. ප්‍ර. වි. ආ. මත වැය අදාළ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශ මගින් ගිණුම් ගත කළ යුතුය.

5.6.3 ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ආධාර මගින් කොටසක් සහ ඒකාබද්ධ අරමුදල් වලින් කොටසක් ද ලෙස ව්‍යාපෘතියට මුදල් යොදවන විට ප්‍රතිපූර්ණය කළහැකි විදේශාධාර හා ඒකාබද්ධ අරමුදල් යන සංරචකයන් දෙකෙහිම අග්‍රිම අවශ්‍යතාවයන් සඳහා අත්මුදල් නිදහස් කරනු ලැබේ.

5.6.4 VI ඇමුණුම මත අග්‍රිම ඉල්ලුම්පත එක් එක් මාසයේ හත්වන දින හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ලැබිය යුතුය. ප්‍ර. වි. ආ. අග්‍රිම සංකේත අංකය යටතේ නිකුත් කරන ලද අග්‍රිම සම්බන්ධයෙන් වූ විට "ප්‍රතිපූර්ණය කල හැකි විදේශාධාර ගිණුම" නමැති වෙනම බැංකු ගිණුමක් පවත්වා ගත යුතුය. මෙම වියදම් වලට අදාළව වෙනම මුදල් පොතක් පවත්වාගෙන යා යුතුය. වාර්තා කරන ලද මාසයට පසු මාසයේ හත්වෙනි දින හෝ ඊට පෙරාතුව නියමිත පරිදි සහතික කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය රා. ගි. අ. ජ. වෙත ඉදිරිපත් කළ යුතුය.

ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත්

5.6.5 ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතන මගින් අප්‍රමාදව ඉදිරිපත් කළ යුතුය. ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම් කිරීමේ ප්‍රමාදය, විදේශාධාර ප්‍රතිලබ්ධ නොකිරීමටත්; විදේශාධාර යොදගත හැකිව තිබියදී දේශීය අරමුදල් භාවිතා කිරීමටත් හේතුවක් වනු ඇත.

5.6.6 ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් අනුක්‍රමික ලෙස අංක කළ යුතු අතර, අදාළ විදේශාධාර ගිවිසුම් මගින් නියම කරන ලද ආකෘති පත්‍ර මත ඉදිරිපත් කළ යුතු වේ. සියළුම ඉල්ලුම්පත් සමග සහතික කරන ලද වියදම් ප්‍රකාශනයක් සහ අවශ්‍ය තන්හිදී ගෙවීම් ලියවිලිවල පිටපතක් ද අමුණා ඇති බවට වගබලා ගත යුතුය. ප්‍රතිපූර්ණය ඉල්ලීම් වල පිටපත් රා. ගි. අ. ජ. ට සහ වි. ස. අ. ජ. ට ඉදිරිපත් කළ යුතුය.

5.6.7 ඉදිරිපත් කරනු ලබන වාර ගණන හා අවම මුදල් ප්‍රමාණය යන විශේෂිත තත්වයන්ට යටත්ව ඉල්ලීම් මාසිකව ඉදිරිපත් කළ යුතු වේ. සැලකිය යුතු ප්‍රමාණයක ඉල්ලීම් පැන නගින අවස්ථාවන්හි දී ඒවා මාසය අවසානයේ දී ඉදිරිපත් කරන ඉල්ලුම් පත් වලට පරිබාහිරව අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු වේ.

5.6.8 ප්‍රතිපූර්ණයන්ට සම්බන්ධ ලැබීම් මහ බැංකුවේ පවත්වන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 19298 ට බැර කළ යුතු බවට සියළුම ඉල්ලුම්පත් වල සඳහන් කළ යුතු වේ. ප්‍රේෂණයන් සෘජුවම ශ්‍රී ලංකා මහ

බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතු බවත්, ඉල්ලුම් කරු හෝ වෙනත් කිසියම් පාර්ශ්වයක් වෙත හෝ නොයැවිය යුතු බවත්, ඉල්ලුම්පත් වල විශේෂයෙන්ම සඳහන් කළ යුතු වේ.

5:6:9 ප්‍ර. වි. ආ. ව්‍යාපෘතීන්ගේ වියදම් වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගෙන අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන විශේෂ භ්‍රමණ විදේශ මුදල් ගිණුම මගින් ප්‍රතිපූර්ණ ඉල්ලීම් කරන අවස්ථා වලදී, එවැනි ප්‍රතිපූර්ණයන් මෙම විශේෂ භ්‍රමණ විදේශ මුදල් ගිණුමෙන් භා. නි. ලේ. ගේ ගිණුමට බැර කරනු ඇත. අනතුරුව ප්‍රදානකරු විසින් විශේෂ භ්‍රමණ ගිණුම ප්‍රතිසම්පාදනය කරනු ඇත.

5:6:10 කිසියම් ප්‍රතිපූර්ණයක් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත සෘජුවම ලැබුණ කල්හි එයින් කිසිදු කොටසක් පරිශීලනය නොකොට සම්පූර්ණ මුදලම අදාළ ඉල්ලුම්පත් විස්තර ද සමග වි. ස. අ. ජ. ට දැනුම් දීමක් සහිතව අප්‍රමාදව රා. ගි. අ. ජ. ට ප්‍රේෂණය කළ යුතුය.

5:6:11 ඉල්ලුම් කළ සහ ලැබුණ ප්‍රතිපූර්ණයන් සැසඳිය යුතු අතර, කිසියම් වෙනසක් තිබේනම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් වහාම වි. ස. අ. ජ. ට, රා. ගි. අ. ජ. ට, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරිට දැනුම්දීමක් සහිතව ප්‍රදාන ආයතනය සමග ඒ පිළිබඳව ක්‍රියාකල යුතුය.

5:6:12 ප්‍රදාන ආයතනය විසින් ප්‍රතිපූර්ණ ඉල්ලීම් පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් හෝ ප්‍රතික්ෂේප කරන ලද කල්හි හෝ ඉල්ලුම් කරන ලද හා ලැබුණ ප්‍රතිපූර්ණයන් අතර කිසියම් විෂමතාවයන් ඇති කල්හි එය විමර්ශනය කර ඒ පිළිබඳව ක්‍රියා කල යුතුය. ප්‍රතිපූර්ණ අඩු කිරීම් සම්බන්ධයෙන් කටයුතු කල නොහැකි සෑම අවස්ථාවකදීම භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව එකී වියදම් ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන වලට මාරු කළ යුතුවේ.

5:6:13 මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන "ප්‍රති අගය කිරීමේ ගිණුම" තුළින් විනිමය අනුපාත විචලනයන් හේතු කොට ගෙන ඇතිවන වෙනස්කම් පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා කරනු ඇත.

5:6:14 ප්‍ර. වි. ආ. ප්‍රතිපාදන, වැය ඉල්ලීම් හා ප්‍රතිපූර්ණ ලැබීම් ආදිය පිළිබඳ වර්තාවක් VII ඇමුණුම පරිදි පවත්වා ගත යුතුය.

5:6:15 ගණන් දීමේ නිලධාරීන්/ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් ප්‍ර. වි. ආ. වැය අඩංගුවන්නා වූ ව්‍යාපෘති සියල්ල පිළිබඳව සමුච්චිත වියදම්, ඉල්ලුම් කරන ලද සහ ලැබුණ ප්‍රතිපූර්ණයන් දක්වෙන මාසික වාර්තාවක් VIII වන ඇමුණුමට අනුකූලව පිළියලකර රා. ගි. අ. ජ. සහ වි. ස. අ. ජ. වෙත ඉදිරිපත් කළ යුතුය.

5:6:16 ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යෙදවීම, වැය ඉල්ලීම් සහ ප්‍රතිපූරණයන් ලැබීම පිළිබඳව ගණන් දීමේ නිලධාරීන් සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් දැඩි අධීක්ෂණයක් පවත්වා ගත යුතුය.

2-

5:6:17 රාජ්‍ය ව්‍යවසායන්ට අදාළ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර

රාජ්‍ය ව්‍යවසායන්ට යෙදවීම සඳහා ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර ප්‍රතිපාදන ඇති විට තම ඉල්ලීම VI වැනි ඇමුණුමේ ආකෘති පත්‍රය (සුදුසු පරිදි වෙනස් කරන ලදුව) පිටපත් තුනකින් යුතුව පිළියෙලකර රා. ගි. අ. ජ. වෙත යැවීම සඳහා අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් මගින් රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් (රා. ව්‍යා. අ. ජ.) වෙත ඉදිරිපත් කළ යුතුය.

රා. ව්‍යා. අ. ජ. විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අවශ්‍ය නිර්දේශයන් සහිතව අරමුදල් නිදහස් කිරීම සඳහා රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ඇත.

5:6:18 අනුචිත වියදම් සඳහා වූ ඉල්ලුම්පත් :

ප්‍රතිපූරණය සඳහා උචිත නොවන වියදම් ප්‍රතිපූරනය කළ හැකි විදේශාධාර ප්‍රතිපාදනවලින් ප්‍රතිපූරණය කිරීමට ඉල්ලුම් කිරීම පිළිබඳව භාණ්ඩාගාරය දැඩි අවධානය යොමු කරයි. එවැනි ඉල්ලුම් ප්‍රදාන ආයතන මගින් ප්‍රතික්ෂේප කරන බැව් සැලකිල්ලට ගත යුතුය. ව්‍යාපෘතිය ගැන ඉතා දැඩිව අධීක්ෂණය කර ප්‍රදානකරු සමග ඇතිකරගත් ගිවිසුමේ වගන්තිවලට අනුකූල වූ වැය පමණක් ප්‍ර. වි. ආ. ට ඇතුලත් කර ප්‍රතිපූරණය සඳහා ඉල්ලුම් කරන ලෙසට වගබලාගන්නා මෙන් ලේකම්වරුන්ගෙන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

5:7 ශිල්පීය සහාය :

5:7:1 ශිල්පීය ආධාර වැඩසටහන යටතේ ලැබෙන සියලුම විදේශීය ශිල්පීය ආධාර පිළිබඳ විස්තර දෙපාර්තමේන්තු වෙන් වශයෙන් පවත්වාගෙන ආ යුතුය. විශේෂඥ සේවා සම්බන්ධයෙන් වූ විට, සේවාවන් සැලසූ විශේෂඥයන්ගේ නම්, ඔවුන්ගේ සේවා කාලය, කාර්යයන්ගේ ස්වභාවය සහ සේවාව සැලසූ රටේ හෝ නියෝජ්‍යත්වයේ නාමය පිළිබඳව වාර්තා තබාගත යුතුය. ඒ ආකාරයෙන් අමාත්‍යාංශවල/දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට ලබාදෙන්නා වූ ශිෂ්‍යත්ව හා අභ්‍යාස පහසුකම් පිළිබඳ සටහන් ද තබාගත යුතුවේ. මෙම සටහන්වලින් ශිෂ්‍යත්වයේ හෝ අභ්‍යාස පහසුකමෙහි වටිනාකම්ද දක්වනු ලැබිය යුතුය. ශිෂ්‍යත්ව වල අභ්‍යාස පහසුකම් වල වටිනාකම් පිළිබඳ නියම තොරතුරු ලබාගත නොහැකි නම් ගමන් වියදම්, යැපීම් දීමනා, පොත්පත් දීමනා, ඇඳුම් සහ වෛද්‍යාධාර දීමනා හා පුහුණු කිරීමට අදල කල්පිත පිරිවැය ආදිය සැලකිල්ලට ගනිමින් වි.ස.අ.ජ.ගේ උපදෙස් ඇතිව වටිනාකම නිගමනය කල යුතුය.

5:7:2 මුදල් වර්ෂයේ සෑම කාර්තුවක් අගදීම මෙහි I ඇමුණුම පරිදි විශේෂඥයන්ගේ සේවාව පිළිබඳ වාර්තාවක් ද II ඇමුණුම පරිදි ශිෂ්‍යත්ව ලාභීන් හා අභ්‍යාය ලාභීන් පිළිබඳ වාර්තාවක් ද විගණකාධිපතිට පිටපත් ද සහිතව වි.ස.අ.ජ. වෙත ඉදිරිපත් කල යුතුවේ.

5:7:3 ශිල්පීය සහයෝගිතා වැඩ සටහන පිරිවැයෙහි කොටසක් වශයෙන් ද්‍රව්‍ය උපකරණ හා මුදල් ද ලැබුණු අවස්ථාවකදී අදළ පරිදි ඉහත 5 : 2 සහ 5 : 4 ඡේදයන්හි සඳහන් ප්‍රදානයන් සම්බන්ධයෙන් වූ විධි විධාන අනුව ඒවා ගිණුම් ගත කල යුතුවේ.

(16)

5:7:4 ශිල්පීය සහයෝගීතා වැඩ සටහනක පිරිවැයේ කොටසක් වශයෙන් උපකරණ ලැබී ඒවායෙහි අයිතිය වැඩ සටහන අවසන් වනතෙක් ප්‍රධානකරු වෙතම තබාගනු ලැබූ අවස්ථාවන්හිදී එම උපකරණ වෙනමම බඩු ලේඛණවල සටහන්කර තැබිය යුතුවේ. වැඩ සටහන අවසානයේදී ඒවායෙහි හිමිකම රජය වෙත පවරන ලද විට, හිමිකම් පැවරීමේ අවස්ථාවේදී එම උපකරණවල වටිනාකම තීරණය කිරීමට මණ්ඩලයක් පත්කල යුතු වන අතර ඒවා ප්‍රදානයන් වශයෙන් ද්‍රව්‍ය හා උපකරණ ලැබීමේදී ගිණුම්ගත කරනු ලබන පරිදි ගිණුම්ගත කරනු ලැබිය යුතුය. ඉහත 5 : 2 ඡේදය බලන්න.

5:7:5 ව්‍යාපෘති ආධාරයක (ප්‍රාග්ධන ආධාරය) පිරිවැයෙහි කොටසක් වශයෙන් ශිල්පීය සහාය ලැබුන අවස්ථාවකදී ව්‍යාපෘතියේ සෙසු සංරචකයන් පරිදිම ගිණුම්ගත කරනු ලැබිය යුතුවේ.

5:8 භාණ්ඩ ආධාර

5:8:1 වි.ස.අ.ර. ගෙන් ප්‍රතිපාදනයන් ලබාගැනීමෙන් පසුව පමණක් භාණ්ඩ ආධාර ප්‍රයෝජනයට ගතහැකි වනු ඇත. මෙම ආධාර වර්ගයේ ආනයනය කළ වටිනාකම රුපියල් වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්නා රජයේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුමට බැරකල යුතුය.

5:8:2 භාණ්ඩ ආධාර යටතේ කරනු ලබන සියළුම ආනයනයන් රාජ්‍ය බැංකු හරහා කල යුතු අතර, ඒ සඳහා සියළුම ලියකියවිලි බැංකුවලට ඉදිරිපත් කළ යුතුය. ලියකියවිලි කිසිවක් ආනයනකරුවන්ට කෙලින්ම ඉදිරිපත් කිරීමෙන් වැලකෙන ලෙසට සැපයුම්කරුවන්ට උපදෙස් දිය යුතුය.

5:8:3 සෑම අවස්ථාවකදීම ආනයනයන්ට අදළ ලියකියවිලි භාරදීමට පෙරාතුව ආනයනයේ වටිනාකම සම්පූර්ණයෙන්ම බැංකුවට ගෙවිය යුතුවේ. රජයේ දෙපාර්තමේන්තු විසින් යෙදෙන පරිදි අදළ ශීර්ෂය, වැඩසටහන, ව්‍යාපෘතිය, වැය විෂය හෝ අත්තිකාරම් ගිණුම යටතේ ප්‍රතිපාදන හර කිරීමෙන් ගෙවිය යුතුය. සංස්ථාවක්/රාජ්‍ය ව්‍යවසායන් තම අරමුදල් වලින් ගෙවීම් කල යුතුය. ගෙවීම ලබන්නාවූ බැංකුව අදළ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වනු ලබන රජයේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුමට ප්‍රේෂණය කල යුතුය.

5:9 විශේෂ (විදේශ මුදල්) ගිණුම

5:9:1 ව්‍යාපෘතියට ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් ලැබීම පහසු කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ඉක්මන් කිරීම සඳහා ප්‍රදානකරුවන් විසින් විදේශාධාර මුදලින් කොටසක් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ විදේශ මුදල් ගිණුමකට ප්‍රේෂණය කරන අවස්ථාවන් ඇති අතර, ප්‍රදානකරු විසින් අනුමත කරන ලද ව්‍යාපෘති වැය, සඳහා එම ගිණුමින් මුදල් ලබාගත හැක. සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම්භාර ආයතන මෙම පහසුකමින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය.

5:9:2 විශේෂ (විදේශ මුදල්) ගිණුම, භ්‍රමණ පදනම මත වන අවස්ථාවලදී ප්‍රතිසම්පාදිත ඉල්ලුම්පත්, සඳහන් කරන ලද කිසියම් අවම මුදල් ප්‍රමාණයකට යටත්ව මාසිකව ඉදිරිපත් කල යුතුය.

5:9:3 විශේෂ (විදේශ මුදල්) යනුවෙන් ප්‍රතිපූර්ණය කරන පදනම මත භාණ්ඩාගාරය මැගින් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට ප්‍ර.වි.අ.වැ.ය සඳහා අග්‍රිම නිකුත්කරන අවස්ථාවන් වලදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් ආපසු

ගැනීමේ ඉල්ලුම්පත් අප්‍රමාදව ඉල්ලුම්කර ශ්‍රී ලංකා මහ බැංකුවේ අංක 19296 දරණ භා.නි.ලේ. ගිණුමට අප්‍රමාදව ප්‍රතිපූරණය කරන බවට වගබලා ගත යුතුය.

5:9:4 විශේෂ (විදේශ මුදල්) ගිණුම්වලට ලැබීම් සහ ආපසු ගැනීම් විස්තර අඩංගු ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලැබුණු පසු ඒවා සසඳා විෂමතාවයන් කිසිවක් ඇත්නම් විමර්ෂණය කර නිවැරදි කළ යුතුය.

5:9:5 විශේෂ (විදේශ මුදල්) ගිණුම භ්‍රමණ පදනමක් මත නොවන විට, ලබාගන්නා ලද අත්තිකාරම් පියවා අවසන් කිරීමට කටයුතු කල යුතුය. ලබාගන්නා ලද අත්තිකාරම්, පියවනලද මුදල් ප්‍රමාණයන් සහ ඉතිරි ශේෂ දැක්වෙන ප්‍රකාශනයන් සෑම මසකම අගදී වි.ස.අ.ජ.ට, රා.ගි.අ.ජ.ට සහ භාණ්ඩාගාරයේ අභ්‍යන්තර විගණන සහ විමර්ෂණ අධ්‍යක්ෂට ඉදිරිපත් කල යුතුය.

5:9:6 භා.නි.ලේ. ට කරනු ලබන ප්‍රතිපූරණයන් හැර, විශේෂ භ්‍රමණ (විදේශ මුදල්) ගිණුම්වලින් දරන්නා වූ වැය 5:3:1 සහ 5:3:2 දරණ ඡේදයේ පරිදි රා.ගි.අ.ජ විසින් ගිණුම්ගත කරනු ලැබේ. තවද ඡේද 5:3:3 සිට 5:3:5 දක්වා ඡේද පරිදිද කටයුතු කල යුතුය.

5:10 වාර්ෂික ගිණුම්

එක් එක් ව්‍යාපෘතීන් සඳහා විගණකාධිපති විසින් නියමිත පරිදි සහතික කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රදාන ආයතන වෙත ඉදිරිපත් කල යුතු අතර, ණය ගිවිසුමේ කොන්දේසියක් ලෙස මෙය ඉදිරිපත් කර ඇති විටෙක විශේෂයෙන්ම මෙම ගිණුම් ඉදිරිපත් කල යුතුවේ. උපචිත පදනම මත පිළිගත් ගණන් තැබීමේ මූලධර්ම වලට අනුකූලව පවත්වාගෙන යන්නා වූ වාර්තා පදනම් කරගෙන ව්‍යාපෘතියේ ගිණුම් පිළියෙල කල යුතුවේ. මෙම අවශ්‍යතාවයන් සපුරාලීම පිණිසත්, වාර්ෂික ගිණුම් අප්‍රමාදව සැකසීම පහසුකිරීම පිණිසත්, මෙබඳු අවස්ථාවලදී ද්විත්ව සටහන් පදනම මත පොත් සහ වාර්තා පවත්වා ගත යුතුය.

6:0 මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු අමාත්‍යාංශ යටතේ ඇති සියළු රාජ්‍ය සංස්ථා සහ මණ්ඩලවල අවධානයට යොමුකරවන මෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

කේ. ෂන්මුගලින්ගම්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

ඇමුණුම 1

මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙතය. 　　　　　　වගන්තිය (4.2.2) සහ(5.7.2)

විදේශාධාර

.... දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී .... අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව ලබාගත් විශේෂඥයන්ගේ සේවය පිළිබඳ වාර්තාව

දෙපාර්තමේන්තුව :................................

විශේෂඥයාගේ නම	පවරනු ලැබූ කාර්යයේ ස්වභාවය	විශේෂඥයාගේ සේවාවන් සැපයූ රට හෝ නියෝජිත ආයතනය	විශේෂඥයා පැමිණි දිනය	විශේෂඥයා පිටත්ව යන දිනය හෝ පැවරුන කාර්යය අවසන් කිරීමට නියමිත දිනය	වෙනත් කරුණු සහ හිඟිවුම් යොමුව

දිනය :......................

දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ { අත්සන :........................
පදවි නාමය :..........................

පිටපත : විගණකාධිපති,

15

ඇමුණුම II

වගන්තිය 4.2.2 සහ 5.7.2

මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙත,

විදේශාධාර

.... දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී .... අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව ලබාගත් ශිෂ්‍යත්ව සහ අභ්‍යාස පහසුකම් පිළිබඳ වාර්තාව

දෙපාර්තමේන්තුව :..............................

ශිෂ්‍යත්වලාභියාගේ හෝ අභ්‍යාසලාභියාගේ නම	අභ්‍යාස යෝජනා ක්‍රමයේ /ශිෂ්‍යත්වයේ ස්වභාවය	අභ්‍යාස යෝජනා ක්‍රමය/ ශිෂ්‍යත්වය ආරම්භ කිරීම සඳහා දිවයිනෙන් බැහැර ගිය දිනය	අභ්‍යාස යෝජනා ක්‍රමය/ ශිෂ්‍යත්වය පවත්නා කාලය	අභ්‍යාස යෝජනා ක්‍රමය/ ශිෂ්‍යත්වය සැලසූ රට	අභ්‍යාස යෝජනා ක්‍රමය/ශිෂ්‍යත්වයේ වටිනාකම	හිටිපුමෙහි යොමුව ඇතුළු වෙනත් කරුණු

දිනය:...............................

දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ { අත්සන :........................ / පදවිය :........................ }

පිටපත : විගණකාධිපති,

ඇමුණුම III

ඇමුණුම III

වගන්තිය 5.2.6

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙතය,

විදේශාධාර

............................දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී උපකරණ හා ද්‍රව්‍ය වශයෙන් ලැබුණු විදේශාධාර ප්‍රදානයන් පිළිබඳ "භාණ්ඩාගාරයේ විදේශාධාර ප්‍රදාන ගිණුමට" කරන ලද බැර කිරීම පිළිබඳ ප්‍රකාශය.

ඇස්තමේන්තුවල ප්‍රතිපාදන පිළිබඳ විස්තර						ප්‍රතිපාදනයට හරකර විදේශාධාර ප්‍රධාන ගිණුමට බැරකරන ලද වටිනාකම රු.	ලැබුණ අයිතමයන් පිළිබඳ විස්තර
ශීර්ෂය	වැඩ සටහන	ව්‍යාපෘතිය	වැය විෂය	මූල්‍යකරණ සංකේතය	මුළු විදේශාධාර රු.		

ඉහත දක්වන ලද පරිදි ඉහත කාර්තුවේදී ලැබුණු උපකරණ සහ ද්‍රව්‍ය කාර්යාලයෙහි පවත්වාගෙන යන බඩු ලේඛනයේ/ලේඛනවල ඇතුළත්කර තිබෙන බව මෙයින් සහතික කරමි.

....

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර

දිනය :..............................

ඇමුණුම IV

වගන්තිය 5.3.5

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත,

විදේශාධාර

..................දිනෙන් අවසන් වූ කාර්තුව තුලදී විදේශාධාර ණය ප්‍රතිපාදනවලට එරෙහිව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් කරන ලද හරවල නිරවද්‍යතාවය තහවුරු කිරීමේ ත්‍රෛමාසික ප්‍රකාශය.

ඇස්තමේන්තුවල ප්‍රතිපාදන විස්තර						හර කරන ලද මුදල රු.	මාසය	භාණ්ඩාගාර පැවරුම් වවුචර යොමුව	සනාථකර තිබේද නැතිද යන්න	එසේ නැත්නම් වෙනත් කරුණු
ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	වැය විෂය	මූල්‍යකරණ සංකේතය	විදේශාධාර ප්‍රතිපාදන රු.					

මෙම හර කිරීම් වලට සම්බන්ධ උපකරණ සහ ද්‍රව්‍ය මෙම කාර්යාලයේ පවත්වන බඩු ලේඛනයේ/ලේඛන වල ඇතුළත් කර තිබෙන බව මම මෙයින් සහතික කරමි.

....

දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන හා තනතුර

දිනය: ....

ඇමුණුම V

ඇමුණුම V
වගන්තිය 5.4.3 සහ 5.5

මහා භාණ්ඩාගාරයේ,
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්,
විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙත.

විදේශාධාර

.... දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී විදේශාධාර ප්‍රදාන/විදේශාධාර ණය පිළිබඳ මුදල් ප්‍රතිපාදන වලින් කරන ලද වැය පිළිබඳ ප්‍රකාශය.

ඇස්තමේන්තුවල ප්‍රතිපාදන විස්තර						භාණ්ඩාගාරයෙන් ලබාගත් ප්‍රතිපාදන ප්‍රමාණය රු.	භාණ්ඩාගාර යොමුව		හරකරන ලද වැය රු.	ප්‍රදාන/ ණය ගිණුමේ නම
ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	වැය විෂය	මූල්‍යකරණ සංකේතය	විදේශාධාර ප්‍රතිපාදන රු.		අංකය	දිනය		

....
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර

දිනය:...............................

ඇමුණුම VI
(වගන්ති 5. 6. 4.සහ 5. 6. 17)

භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත,
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවේ නම :-

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර

.... මාසය වෙනුවෙන් අග්‍රිම ඉල්ලුම් පත

1	2						3	4	5	6	7	8
ව්‍යාපෘතිය හා ප්‍රදානකරුගේ විස්තර	වර්ෂය සඳහා ප්‍රතිපාදන මුලය						පසුගිය මාසය දක්වා ලබාගත් අග්‍රිම	ප්‍ර.වි.අ. සහ ඒ.අ. ප්‍රතිපාදන වලින් ශේෂය (සී 2 - සී 3)	ලබාගත් අග්‍රිමවලින් ප්‍රයෝජනයට ගත් මුදල	සිටෙන අග්‍රිම වලින් ශේෂය	මේ මස සඳහා අවශ්‍ය අග්‍රිම	පසුගිය මාසය දක්වා වර්ෂය වෙනුවෙන් ඉල්ලන ලද ප්‍රතිපූරණය
	මුල්‍යකරණ මූලාශ්‍රය	ශීර්ෂය	වැඩ සටහන	ව්‍යාපෘතිය	වැය විෂය	මුදල						
						රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
	ප්‍ර.වි.ආ.(ණ) ප්‍ර.වි.ආ. (ප්‍ර) ඒ.අ.											

බැර විස්තර

අවශ්‍ය දිනය	බැංකුවේ නම	ගිණුම් අංකය	මුදල
....	....	....	
			මුළු මුදල ______

............මාසය සඳහා මුදල් පොත............ දිනට බැංකු ශේෂය සමග සසඳන ලද බව මෙයින් සහතික කරමි.

....
අමාත්‍යාංශයේ ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර

ඇමුණුම VII
වගන්තිය 5, 6, 14

ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර පිළිබඳ වාර්තාව............................වර්ෂය

ව්‍යාපෘතියේ නම ....

1	2	3	4	5					6							
				ව්‍යාපෘතියේ වැය					මුළු වැයෙන් ප්‍රතිපූර්ණය කළ යුතු මුදල							
									i ශ්‍රී ලංකා රුපියල්			ii විදේශ මුදල් ප්‍රමාණය				
ආධාර මූලය	ගිවිසුම් අංකය සහ දිනය	ප්‍රතිපූර්ණය කළ හැකි වියදමෙහි ස්වභාවය	ප්‍රතිපූර්ණය කිරීමේ පදනම	පසුගිය වර්ෂයේ මුළු මුදල	මේ වර්ෂයේ .... මස දක්වා	මේ මාසයේදී	මේ මුදල් වර්ෂයේ මේ මාසයෙහි අග දක්වා මුළු මුදල (ආ) + (ඇ)	මුළු මුදල (අ)+(ඈ)	පසුගිය මුදල් වර්ෂය	වර්තමාන මුදල් වර්ෂයේ මේ මාසය දක්වා	මුළු මුදල (අ)+(ආ)	ව්‍යවහාර මුදල	විනිමය අනුපාතය	පසුගිය මුදල් වර්ෂය	වර්තමාන මුදල් වර්ෂය	මුළු මුදල (අ)+(ආ)
1	2	3	4	(අ)	(ආ)	(ඇ)	(ඈ)	(ඉ)	(අ)	(ආ)	(ඇ)			(අ)	(ආ)	(ඇ)
				රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.		රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.

සම්බන්ධිතයි......

ප්‍රතිපූරණය කළ යුතු විදේශාධාර පිළිබඳ වාර්තාව -(සම්බන්ධිතයි)

7						8				9				10	11
ප්‍රතිපූරණ ඉල්ලීම						ලැබුණු ප්‍රතිපූරණයන්				මුදල් ප්‍රතිපාදන පවත්නා මුදල් වර්ෂය				මා. නි. ගේ. කෙටි'සන	වෙනත් කරුණු (වෙනස්කම්, අවුසිරිම් ආදිය)
(අ) පසුගිය වර්ෂයේ අවසානය දක්වා	(ආ) පවත්නා මුදල් වර්ෂයේ අන්තිම මාසය අවසානය දක්වා	(ඇ) මෙම මාසයේදී ඉල්ලීම	(ඈ) පවත්නා මුදල් වර්ෂයේ මේ මාසය අගට ඉල්ලුම් කරන ලද මුළු එකතුව (ආ) +(ඇ)	(ඉ) ඉල්ලුම් කළ සම්පූර්ණ මුදල (අ) +(ඈ)	(ඊ) මේ මාසයේ අගට ඉල්ලුම් කළ යුතු ශේෂය සිරු 6(1) (ඈ)-7(ඉ)	(අ) මෙම මුදල් වර්ෂයේ අන්තිම මාසය අවසානයේ දී මුදල	(ආ) මේ මාසයේ දී ලැබුණු මුළු මුදල	(ඇ) එකතුව (අ) + (ආ)	(ඈ) මේ මස අගට ලැබිය යුතු ශේෂය7(ඉ)—8(ඇ)	(අ) මුල් ප්‍රතිපාදනය	(ආ) වෙනස්කිරීම	(ඇ) ශුද්ධ	(ඈ) 6(1)(ආ) තීරුවේ වැය කෙරෙන යනදා ලද අතිරික්තය/ඉතිරිය		
රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ.	රු. ශ		

සටහන.— ශෙදනික ගනුදෙනු වල සෙසු වාර්තා දිගටම පවත්වාගෙන යනු ලැබේ.

ඇමුණුම VIII

ඇමුණුම VIII

5:6:15 වගන්ති

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත,
ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර ශාඛාව,
මහා භාණ්ඩාගාරය, කොළඹ 01.

.... මාසය සඳහා

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව					වැය ශීර්ෂ අංකය					
1	2	3	4	5	6 පවත්නා වර්ෂයේ ඇස්තමේන්තු වල ප්‍රතිපාදන			7 වැය		
වැඩ සටහන ව්‍යාපෘතිය වැය විෂය	ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය	ආධාරයේ ස්වභාවය	ආධාරය ලැබුණේ කොහෙන්ද? ගිවිසුම් අංකය සහ දිනය	ප්‍රතිපූරණයේ පදනම (මුළු මුදල%ආදිය)	(අ) මුළු ප්‍රතිපාදනය	(ආ) වෙනස	(ඇ) ශේෂය	(අ) පවත්නා වර්ෂයේ වැය මෙම මාසයේ අවසානය තෙක්	(ආ) පසුගිය වර්ෂයේ වැය කිසිවක් ඇත්නම්	(ඇ) මෙම මාසය අවසානයේ මුළු වැය
රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.

සම්බන්ධිකයි......

.... මාසය සඳහා

ප්‍රතිපූරණය කල යුතු විදේශාධාර —(සම්බන්ධිතයි)

8				9				10	11
ප්‍රතිපූරණ ඉල්ලීම				ප්‍රතිපූරණ ලැබීම්					
(අ)	(ආ) ඉල්ලුම් කල මුදල		(ඇ)	(අ)	(ආ)	(ඇ)	(ඈ)		
ඉල්ලුම් කල හැකි මුදල	පසුගිය මාසය දක්වා	මේ මාසයේ අග දක්වා මුළු මුදල	ඉල්ලුම් කල හැකි ශේෂය	අන්තිම මාසය දක්වා ලැබුණු මුදල	මේ මාසයේ ලැබුණු මුදල	ලැබුණු මුළු මුදල	ලබා ගත හැකි ශේෂය	ප්‍රතික්ෂේප කරන ලද මුදලක් ඇත්නම් හේතු සහිතව	වෙනත් කරුණු
රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.

පිටපත් — ප්‍රධාන ගණන් තැබීමේ නිලධාරි, විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්, මුලා ප්‍රතිපත්ති සහ ආදායම් අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරි, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරි, විගණකාධිපති.

අත්සන : ....

පදවි නාමය : ....

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව : ....

දිනය: ....